# හිම බිමේ සුදු රෝස 11

විද්‍යානි මනතුංග ලියයි

**මෙතෙක් කතාව**

**උසස් අධ්‍යාපනය හමාර කිරීමෙන් පසු පර්ත් වලින් පිටත්ව යන ලහිරු නැවත වරක් පර්ත් පැමිනෙන්නේ හදවතට දැනීයන නුපුරුදු එහෙත් සුන්දර වූ ආදරයක ස්පර්ශයක් නිසාය. නමුත්, ඉරණම් සහගත ලෙසට තම දෙනෙත් අබියසදීම අහිමි බවට පත්වන ආදරයක මතක සටහන් සමඟ හුදකලා වීම වෙනුවෙන් මව් බිම කරා යන ලහිරුට, නැවත වරක් ටාන්‍යා ලංකාවේදී මුණගැසේ. එහෙත් මේ සියලු දෛවෝපගත සිදුවීම් අතරද ඔහු ධෛර්යයෙන් යුතුව ජීවිතයට මුහුණ දීමට උත්සාය දරයි.**

**එදා ඒ** අවස්ථාවෙන් පසු මහේල හෝ ටාන්‍යා රටින් පිටව යන තුරුත් මට මුණ ගැසුනේ නැත. පසුව අම්මාගෙන් දැනගත් පරිදි ටාන්‍යාව ලංකාව පුරා බොහෝ ස්ථානවලට රැගෙන ගොස් තිබුණේ අම්මා සහ තාත්තාය. නමුත් මම ටාන්‍යා පිළිබඳව හෝ, මහේල පිළිබඳව හෝ, ඒ ගිය ගමන් කිසිවක් පිළිබඳව හෝ, විස්තරාත්මකව තොරතුරු සෙවීමට නොගියෙමි. කෙසේ වුවද, එසේ හෝ ඈ සතුටු කර පිටත්කර හැරීම ගැනද, ඒ කිසිවකට මා විශේෂයෙන් සම්බන්ධ කර ගැනීමට තරම් ඔවුන් උනන්දුවක් නොදක්වා තිබීම ගැනද මම සතුටට පත් වුණෙමි.

අම්මා හෝ වෙනත් කිසිවෙකු හෝ ඉන්පසුව ටාන්‍යා පිළිබඳව කිසිවක් මා සමඟ කතාබහ කළේ නැත. නමුත් මගේ විවාහය වෙනුවෙ-න් අම්මා ඈ තුළ වූ ප්‍රශ්නය නැවත මතුකර ගන්නා ලදී. මේ රැකියාව නිසා රට හැමතැනම යන්නට සිදුවන බැවින් මීට වඩා ස්ථිරත්වයක් ඇති රැකියාවකට මාරු වී ඒ ගැන කතාකරමුයි මම එවර ඈ නිහඬ කළෙමි.

.............

කාලය තවත් වසර එකහමාරක් පමණ ඉදිරියට ගලා ගියේය. තාත්තා දිනක් මා සොයා මම වැඩකරන තැනට පැමිණියේය. ඒ වන විට තාත්තා ඉස්සර දී තරම් දැඩි බවක් මා කෙරෙහි නොපෙන්වන්නට විය.
"තාත්ත..., ඇයි මේ හදිස්සියක් ද?"

"නෑ පුතා හදිස්සියක් නෙමෙයි... පුතත් එක්ක ටිකක් කතා කරන්න හිතුන... ඒකයි... මම මේ කොළඹ වෙන වැඩකටත් එක්ක ආව ගමන්... නිවාඩුවක් තියෙනව නම් යමු අපි ටිකක් එළියට..."
මම වරුවක් නිවාඩු ගෙන ඔහු සමඟ ඉවතට ගියෙමි. නමුත් ඔහු මේ පැමිණ ඇත්තේ මා මුණගැසීමේ අරමුණින් ම විය යුතුය.

"යමු අපි කොහේ හරි හෝටලයකට පුතා... පොඩ්ඩක් නිදහසේ කතා කරන්න..."

"නිදහසේ කතා කරන්න නම් යමු මුහුදු වෙරළට තාත්ත..." මා කියුවේ වැඩිදුර හිතා නොවේ. තාත්තා සිනාසුනි.
"ඒක ඇත්ත. එතන තරම් නිදහස් තැනක් වෙන කොහේ ද?"
ගාලු මුවදොර පිටියේ ගල් බංකුවක් මත මා සමඟ වාඩි වූ තාත්තා බොහෝ දෑ කතා කළේ ය. එහෙත් ඔහු ආ කාරණය තවම ප්‍රශ්නයකි.
"තාත්ත අද ඉන්නව ද කොළඹ?"

"බෑ පුතා අම්ම තනියම..."

"ඒක තමයි මම පුදුම වුණේ ඇයි අම්ම ආවෙ නැත්තෙ කියල..."
තාත්තා ඊට පිළිතුරු දුන්නේ නැත. අම්මා නැතිව ඔහු පැමිණ ඇත්තේ මා සමඟ බැරෑරුම් කතාවකට විය යුතුය.

"පුතා..... ඔයාගෙ අම්ම මට මුණගැහෙන කොට මම ඔයාට වඩා අවුරුදු ගණනක් බාල කෙනෙක්..." තාත්තා මතුකරගෙන එන්නේ මා සැකකරමින් සිටි ප්‍රශ්නයයි. ඔහු කියන කුමන හෝ දෙයකට නිසලව සවන්දීමට මම සූදානම් වුනෙමි.

"මම ඔයාව හම්බවෙන්න ආවෙ... පුතාගෙන් අහන්න... ඔයාගෙ හිතේ කවුරුහරි ගැන අදහසක් එහෙම තියෙනව ද කියල......?" තාත්තාට දිය යුතු පිළිතුර පිළිබඳව දෙවරක් සිතීමට මට උවමනා නැත.
"මගෙ එහෙම මුකුත් අදහසක් නැහැ තාත්ත...."

"එහෙම මොනව හරි තියෙනව නම් අපිට කියන එක ඔයාට වරදක් වෙන්නෙ නැහැ ලහිරු..."

"මම කිව්වනෙ තාත්ත.... මගෙ එහෙම මුකුත් නැහැ කියල...."

මම ඊට පිළිතුරු දුන් ආකාරය පිළිබඳව තාත්තාගේ සිතේ වේදනා-වක් හටගත්තා දැයි මොහොතකට සංවේගී හැඟීමක් සිතේ මතුවිණි. මට ඒ ආදරණීය හදවත රිදවීමේ කිසිදු අවශ්‍යතාවක් නොමැත. නමුත් හොඳ සිහි බුද්ධියකින් පසුවන පුද්ගලයකු වශයෙන් මීට වඩා වෙන කුමන ආකාරයේ පිළිතුරක් මා මුවින් පිටවිය යුතුදැයි මම නොදැන සිටින්නෙමි.......
මොහොතක් නිහඬව සිටි තාත්තාම නැවත කතා කලේය.
"ලහිරු.... ජීවිතේ අපි බලාපෙ-රොත්තු වන දේවල් ම අපිට හැමදාම සිද්ධ වෙන්නෙ නැහැ පුතා. එහෙමයි කියල ජීවිතේ එතනින් නවතින්නෙත් නැහැ...... ජීවත් වෙනවයි කියන්නෙ..., ඒ නැවතිච්ච තැනින් ජීවිතේ ආපහු පටන් අරන් ඉදිරියට අරන් යන එකයි පුතා...."

මම ඒ හැබෑ ජීවන සත්‍යය හොඳින් හඳුනාගෙන සිටින්නෙක් වෙමි. මේ වන විට මා විසින් සිදුකර තිබෙන්-න් ද ඔය ටිකම නොවේ දැයි යනුවෙන් සිතේ මතුව එන ප්‍රතිචාරය මා වෙතම තබාගැනීම සඳහා පමණක් බවද මම දැන සිටියෙමි.......

බලාපොරොත්තු මල්එල ගන්වාගත් ආදරයක් තුළ සිට එසේ නො-වන්නෙකුට උපදෙස් දීම ඉතා පහසු වැඩකි. නමුත් එය ක්‍රියාවේ යෙදවීම සිතන තරම් පහසු නැත.... ඒ හැරත්...... බිඳී ගිය ආදරය... ජීවිතය පමණක් නොව ආත්මයද ඒ තුල සිර කර දමන්නේය....



ආත්මය
අහිමි කරගත්තෙකුගෙන් අළුත් ආදරයක් ඉල්ලා සිටීම......පුස්කා ගිය මදයක් සහිත බීජයක් පොළවෙහි සිටුවා පැළයක් ප්‍රාර්ථනා කරන්නා වැනි වූ මෝඩ ක්‍රියාවක් නොවන්නේද......?

මම තාත්තා දෙස නොබැළුවෙමි. ඒ වෙනුවට තෙරක් නොපෙනෙන අනන්තය දෙසට නෙත් යොමු කලෙමි. ආත්මානුකම්පාව පිළිබඳ හැඟීමක් හදවතේ අඳුරු කොනක සිට හිස එසවීමට යත්න දරයි.... යළි යළිත් බිඳී විසිරී යමින් ඒ සඳහාම නැඟී එතැයි සිතිය හැකි රළපතරේ චමත්කාරජනක දසුන සියුම් හසරැල්ලක සඳහනක් සඳහා මුලපිරීමක් යැයි සිතීමට මම උත්සාය ගතිමි. අහිමි වසන්තයක එල නොදරන පැතුම් මල පිළිබඳ මතකය සුසුමක දවටා හිස් අවකාශයට මුදාහැරියෙමි.....

මම අමුතුවෙන් කිසිවක් තාත්තාට කියන්නට ගියේ නැත. අම්මාත් තාත්තාත් මා පිළිබඳව සියල්ල සැකකරනවා විය හැකිය. නමුත් මගෙන් ඉඩක් නොලබා ඒ කිසිවක් ගැන ඔවුන්ට කෙළින්ම මා සමඟ කතා කළ නොහැක.
"තාත්ත... ඔයා අදම ගෙදර යනව නම් රෑ වෙනකම් ඉන්න එපා... අපි දැන් මොනව හරි බොන්න යමු..."
මම නැගී සිටියෙමි. තාත්තා විසින් මගේ අදහස් සියල්ල වටහා ගනු ලැබී යැයි මම සිතමි. ඔහු ඉන් ඉදිරියට මගේ විවාහය ගැන කිසිවක් කතා කරන්නට ගියේ නැත. කිසිවක් බීම සඳහා නැවතීමට නොහැකියැයි තාත්තා පැවසූ බැවිනි අපි වටාපිටාව ගැන කතාබහේ යෙදෙමින් ඔහු වාහනය නවතා තිබූ තැනට ඇවිදගෙන ගියෙමු.

තාත්තා පිටත්ව යෑමට ප්‍රථම මා දෙස නිහඬව මොහොතක් නැවතී බලාසිටියේ දයාබරිත බැල්මකි... ඉන්පසුව මගේ පිටට තට්ටු කරමින් ඔහු කීවේ මා බලාපොරොත්තු නොවූ දෙයකි.
"පුතා..... ඒ කාලෙ මම උඹ ගැන බය වුණා... උඹ නාස්ති වෙයි කියල... ඒත් උඹේ 1
තාත්ත හැටියට, මම අද උඹ ගැන ආඩම්බර වෙනව ලහිරු..." ඒ ටික කියද්දී ඔහුගේ දෑස් තෙත්වී තිබිණි. දෑතින් ම මා වැළඳගත් තාත්තා ඉන්පසු මොහොතකට හෝ ප්‍රමාද නොවී කාරයට ගොඩ විය.

...............

තාත්තා එසේ මට මුණගැසී වැඩි දවසක් යාමට පෙර තැපෑලෙන් මා නමට ආරාධනා පතක් පැමිණියේය. එය මංගල උත්සවයක් පිළිබඳව විය යුතු යැයි විවෘත නොකරම කිව හැකිය. මා එය විවෘත කළේ කාගෙන් ද යන්න දැන ගැනීමේ කුහුලකිනි. එය මහේලගෙන්ය........ ''මහේල... ටාන්‍යාව... විවාහ කර ගන්නවා...'' ය යන හැඟුම ක්ෂණික කම්පණයක් සිතට ඇතිකරලූයෙන් මම එය එක්වරම වසා දැමුවෙමි. නමුත් එහි වූයේ ටාන්‍යාගේ නම නොවේ යැයි සැකයක් මතුවූයෙන් මම එය නැවත විවෘත කර බැලුවෙමි.
"සාරධා..." එහි වූයේ වෙනත් නමකි.... ටාන්‍යාගේ නම වෙනස්කර තිබේ ද...? දෙමාපියන්ගේ නම් එහි නූන බැවින් ඉන් එහා මට කිසිවක් සිතාගත නොහැකි විය. නමුත් මගේ හදවත ඒ අලුත් නම නිසා ගිනි වැදුණේය.
"මහේල මට පොරොන්දු වුණා ටාන්‍යාට දුකක් නො-දෙන බවට... එසේ නම් මේ මොකද්ද...?" මේ බව පැහැදිලි කරගත හැක්කේ ද මහේලගෙන් ම ය. ඔහුට කතාකල හැකි දුරකථන අංකයක් මම දැන නොසිටියෙමි. මම පර්ත් සිටිය දී හඳුනාගත් යහළුවන් කිහිප දෙනෙකුට ම කතා කළෙමි. නමුත් ඔවුන් කිසිවකුත් ඒ ගැන දැන සිටියේ නැත. එහෙත් තව සතියකින් පැවැත්වෙන මංගල උත්සවය ස්ථිර එකකි. ඔවුන්ට ද ආරාධනාපත් ලැබී තිබිණි. මට හදිසියේ ම සිහිවුණේ අම්මාය. මම මොහොතක් හෝ පමා නොවී ඈයට කතා කළෙමි.
"අම්ම... මට මහේලගෙ ටෙලිෆෝන් නම්බර් එක ඕනැවෙලා තියෙනව පොඩි හදිස්සි යකට...."

"මං ළඟ ඇති පුතා... මම හොයල කෝල් කරන්නම් ආයෙත් ඔයාට..."
"නෑ. මම ලයින් එකේ ඉන්නම්... අම්ම හොයල කියන්න..." ඈ පුදුම වුව ද මට එය ඉක්මනින්ම සොයා දුන්නාය. මා මහේල ඇමැතුවේ පුපුරා යන කෝපයකිනි.

